
ලංකාවිත්ති
LANKA VITHTHI

LANKA VITHTHI
P. O. BOX 6 4 6 7 8
LONDON NW3 9LS
E N G L A N D

*Phone* : 0 2 0 7 4 2 8 9 3 8 8
*Fax* : 0 8 7 1 9 0 0 5 1 6 3
*E-mail* : lanka.viththi @ virgin.net

කර්තෘ : දයා ආනන්ද රණසිංහ
*Editor* : Daya Ananda Ranasinghe

චිත්‍ර : චන්දන සෙනෙවිරත්න
*Art* : Chandana Seneviratna
පරිගණක කටයුතු : චන්න කබ්රාල්
*Computer Graphics* : Channa Cabraal
ඡායාරූප : ආනන්ද කාරියවසම්
*Photography* : Ananda Kariyawasam



## හරි පාරට ගැනීම !

**මේ** දවස්වල අප රටේ ශ්‍රීලංකාවේ බොහෝ දෙනා කතාකරන ප්‍රධානම කාරණය නම් මේ ළඟදී විවෘතකළ අලුත්ම අධිවේගී පාරයි. එහි ඇති අනර්ඝත්වය එහි ඇති පහසුකම ප්‍රමාද නොවී ගමන්බිමන් යෑමට දැන් ඇති අවස්ථාව හා රටේ ගමනාගමනයට ඉන් ඇති විය හැකි ප්‍රයෝජන ආදී සියක් දේ පවසනු ඇසිය හැකිය. අලුත් අධිවේගී මඟ අප රටේ ජනතාව කෙසේ පිච්චිච් කරනු ඇද්ද යන්නත් විමසුම් ඇසින් බලන පිරිසක්ද සිටිති. රජයට පක්ෂපාත අය සිතන්නේ එය මේ රජයෙන් කළ මහා ආශ්චර්යමත් කටයුත්තකි ලෙසට ය. මක්නිසාද, ලංකාව ආසියාවේ ආශ්චර්ය බවට හරවන්නට යන බව වර්තමාන රජය නිතර දෙවේලේ පුන පුනා කියන නිසා ය.

මේ සියල්ල සාක්ෂාත් කරගන්නට අවශ්‍ය මුලිකම දේ අපේ ජනතාවට නැතිබව පමණක් මට කිව හැකිය. ඒ මුලික දේ හඳුන්වන්නේ විනය හෝ හික්මීම යන වචන වලිනි. අපේ ජනතාවට හරි විනයක් නැත. හික්මීම අතින් ඔවුන් ඉතා දුර්වලය. අපේ ජනයා හැසිරෙන, කතාබහ කරන, අදහස් ප්‍රකාශ කරන, කන බොන, අඳින පළඳින, ආශ්‍රය කරන මේ ආදී නොයෙක් අවස්ථාවන්හි ඔවුන්ගේ මෙම විනය හීනත්වය හොඳින් දක්නට හැකිය. අපට වඩා හොඳින් අප ගැන වෙන කවුරු දනිත් ද?

ලංකාවේ ප්‍රධාන දහම බුදුදහම වුවත් බහුතරය බෞද්ධයන් වුවත් ඒ දහමේ මූලික වශයෙන් උගන්වන ඉවසීම හා මනා හැසිරීම ඒ බහුතරය ප්‍රගුණකර නැත. එය පිළිපදින්නට අවශ්‍යතාවක් ද ඔවුනට නැත. ප්‍රගුණකළ අය වෙත් නම් ඒ ඉතා සීමාසහිත පිරිසකි. හේතුව අපේ ජනතාවට හොඳ නරක හඳුනා ගන්නට හැකිකම නැතිකම නොව තම වාසිය තකා ඔවුන් ඒ දහම්වලින් බැහැරටගොස් සිටීමයි. දැන් ඒ ගතිය රෝගයක් සේ අප රටේ සාමාන්‍ය ජන ජීවිතයට තදින් කාවැදී ඇත.

මේ නිසාම රටේ ඇති නීති කැඩීම, ඒ නීති නොතකා කටයුතුකිරීම, නීතියෙන් රිංගා යන්නටම මානබැලීම ආදිය ලංකාවේ දෛනික පුරුද්දක් බවට පත්ව ඇත. මේ තත්වය ඇති ඕනෑම රටක පාලනය ඉතා අපහසු අවදානම් තත්වයට වැටේ. එය වැලැක්විය නොහැකි ය.

පිටරට සංචාරයකට ගොස් නැවත ලංකාවට යන ලාංකිකයන් නිතර කියන කතාවක් නම් "පිටරට මිනිස්සුන්ගේ ඉවසීම හා නීති රීති පිළිපැදීම අපේ මිනිස්සුන්ට නැහැනේ" යන්නයි. පිටරට සංචාරයට නිතර යන දේශපාලකයින් ද මෙම කතා කියතත් ඒ අනුව ලාංකිකයා හැඩ ගස්වන්නට ඔවුන් කිසිවෙකු උත්සාහ ගත්තේ ද නැත. රටේ නීතිරීති වැඩියෙන්ම කඩන්නේද, විනය විරෝධී ලෙස වැඩියෙන්ම හැසිරෙන්නේ ද දේශපාලකයින් බව ජනතාව දනිති. ආදර්ශයක් දෙන්නටද ආදර්ශයක් ගන්නටද කෙනෙක් ලංකාවේ නැත. නවීන පන්නයේ යානවාහන, පාරවල් තාක්ෂණික මෙවලම් භාණ්ඩ වලින් ලංකාව පිරෙව්වත් අපේ ජනතාවගේ විනය හදනතාක් කල් ලංකාවේ දියුණුවක් දක්නට හැකිවනු නැත. රටට ආදරයක් ඇත්නම් මේ රජය කළ යුත්තේ ලාංකිකයා විනය තුළ පිහිටුවා හරි පාරට දැමීම ය.

# චාම්කම පදනම් වූ කිතු උපත



♦ ගරු සුනිල් රූපසිංහ පියනම විසිනි

**කි**තු උපත බොහෝ දෙනෙකුගේ දිවිය වෙනස් කළ බව නොරහසකි. දෙදහස් වසරකට පසුව ද අප එතුමන්ගේ උපත සමරණුයේ ඒ නිසාම ය. කිතු උපත සිහිකිරීමකට පමණක් සීමා කිරීමට අප අකමැති ය. ලොව කිතු උපත සමරණ නත්තල වාණිජමය අවස්ථාවක් කිරීමට කවුරුන් කොතරම් තැත්කළද බොහෝ කිතුනුවෝ ඊට යට නොවෙති.

නත්තල යනු පවුලේ අය එකමුතු කරන, කැඩී බිඳීගිය සබැඳියාවන් යා කරන මහඟු සමයකි. සමහර විට අප මේ ගැන නොසිතනවා විය හැක. පවුලේ සැමදෙන එකතුවනුයේ ආහාර පාන ගැනීමට පමණක් කියා හිතනවා ඇත. අපගේ ශ්‍රමය වැයවනුයේ ද චාරිත්‍රයක් වන ගෙවල් දොරවල් කලඑළි කිරීම, ඇඳුම් පැළඳුම්, කෑම බීම, තෑගිබෝග ආදියට විය හැක. එහෙත් ඒ චාරිත්‍ර තුළින් අප අනිවාර්යයෙන්ම ඉඟි කරනුයේ කිතු උපත සමරණ නත්තල අප එකම පවුලක් බවට සෙමෙන් පත්කරන වග ය.

අවුරුද්ද පුරා පවුලක් අතර, නෑ මිතුරන් අතර සිදුවන අනේක මාදිලියේ ගැටුම් එමට ය. විවිධ අදහස් උදහස්. කරන කියන දේ වෙනස්වීම මත ගැටුම් ඇතිවීම ස්වාභාවික ය. එසේ වුව ද නත්තල එම ගැටුම් සියල්ල අමතකකර කිතුනු අප ආපසු පවුලක් වශයෙන් ද, නෑ හිතමිතුරන් මෙන් ද එකමුතු කර, අප එකිනෙකා වැළඳගැනීමට මං පාදන්නේ ය. නිවෙස් බැහැදැකීම, ආහාරපාන වැළඳීම, තෑගි බෝග බෙදාගැනීම නත්තලේ වැදගත් අංගයන් වන්නේ ඒ නිසා ය.

අද ලෝකයේ දස අත ගැටුම්, යුද කලබල බොහෝ ය. ඒ නිසාම ලොව වැඩි දෙනෙකුට දුකෙන් කණගාටුවෙන් ජීවත්වන්නට සිදුව ඇත. මේවාට විසඳුම් සොයන්නට බොහෝ දෙනා මහන්සිවන නමුත් විසඳුම පේනතෙක් මානයක වත් නැත. මේ ව්‍යසනවලට මූලික හේතුව මිනිසාට සාමයෙන් සමාදානයෙන් ඉන්නට බැරිකම ය.

මුදල් තනන්නට කෑදර කමෙන් ගම්බිම්, දේශසීමාවලට කෑදරකමෙන් දිනෙන් දින සහෝදරත්වයෙන් ඈත්වන මිනිස්සු ඇනකොටා ගනිති. තමන් වැනිම තවත් මනුෂ්‍යයින් විනාශකර දමති. ලෝ සතුන් කෙරෙහි හොඳ හිත සාමය සංකේතවත් වන නත්තල වැදගත් වන්නේ මෙහි දී ය. ජේසුතුමන් ඉපදුනේ දිළිඳු ගවහලක ය. සියලු දෙයින් අනූන මහා මන්දිරයක නොවේ. නත්තල යනු එතුමන්ගේ උපත සිහිකිරීම ය. නත්තල චාම් උත්සවයක් වියයුතු මිස මිළමුදල් විසිකරන සුබෝපොභෝගී සැණකෙළියක් ලෙස සිතීම වැරදි ය. ලොවපුරා වෙසෙන බහුතර ජනතාව දිළින්දන් බව මතක තබාගන්න. සිතින් දිළින්දෝ භාග්‍යවන්තයෝ යයි ජේසුතුමෝ කී සේක. සිතෙහි දිළිඳුකම යනුවෙන් උන්වහන්සේ අදහස් කළේ නිහතමානීකමයි. හීනමානයෙන්, උඩඟුකමෙන්, කුඩුකේඩුකමෙන්, වෛරයෙන්, ඊර්ෂ්‍යාවෙන් මිදුණු සිතක් ඇතිව සිටීම ය. එවන් සිතක ඇතිවන්නේ කරුණාවයි.

එහෙත් අපේ සිත් දුබල ය. හීන මානයෙන් පිරී ඇත. එය වසාගනු වස් අපි උඩඟුකම නමැති වෙස්මුහුණ පළඳිමු. ඉන් අප කරනුයේ අපටම අවැඩකි. දෙවියන් කෙරෙහි ඇති විශ්වාසයට පටහැනි වූ ක්‍රියාවකි.

එබැවින් මේ ලබන්නාවූ නත්තල අප සිත් මෙලෙක් කර, අප මනස සාමයේ සුවඳින් තවරා, අපේ ක්‍රියාවන් ජේසු උපත මෙන් ලොව ආලෝක කරන යහපත් අංශයකටම යොමු කරන්නට අධිෂ්ඨාන කරගනිමු.

ඔබ සැමට සාමය, සතුට, සෞභාග්‍යය පිරි අසිරිමත් නත්තලක් වේවා!

***දිව්‍ය සත්ප්‍රසාද නිකාය***
**Chicago, Illinoise, USA**

## ශුද්ධ ලියවිල්ලේ ජේසුතුමන්ගේ කියුම්

★ **ඔ**බේ සතුරන්ට ප්‍රේම කරන්න. ඔබට වෛර කරන අයට යහපත කරන්න. ඔබට සාප කරන්නන්ට සෙත් පතන්න. ඔබට ගැරහුම් කරන්නන් උදෙසා යාඥා කරන්න. ඔබේ එක කම්මුලකට අතුල් පහර දෙන අයට අනෙක් කම්මුලත් පාන්න. ඔබේ උතුරුසලුව පැහැර ගන්නාගෙන් ඔබේ අඳනය වුව ද වළක්වා නොගන්න. ඔබ සතුදේ පැහැර ගන්නාගෙන් යළිත් එය නොඉල්ලන්න. අනුන් ඔබට යමක් කරනවාට ඔබ කැමත්තහුද? ඔබත් ඔවුනට ඒ දේම කරන්න. **(*ශුද්ධවර ලූක්* 6 :27)**

★ **න**රක පල දෙන හොඳ ගසක්වත්, හොඳ පල දෙන නරක ගසක්වත් නැත. එක එක ගස එහි පලවලින් හඳුනාගනු ලැබේ. මිනිස්සු කටු ගස්වලින් අත්තික්කා පල නෙලා නොගනිති. ගොකටු පඳුරකින් මිදි කඩා නොගනිති. යහපත් මිනිසා තම සිතෙහි නිදන් කළ දෙයින් යහපත් දෙයද, අයහපත් මිනිසා අයහපත් දෙයින් අයහපත් දෙයද උපදවයි. මන්ද? සිතෙහි උතුරා යන දේ කටින් පිටවෙයි. **(*ශුද්ධවර ලූක්* 6 :43)**



★ **ඔ**බේ ඇසේ ඇති ලී කොටය නොතකා ඔබේ සහෝදරයාගේ ඇසේ ඇති ලී තුඩගැන නොබලන්න. පළමුව ඔබේ ඇසෙන් ලීකොටය පහකරන්න. එවිට සහෝදරයාගේ ඇසෙන් ලී තුඩ පහ කරන්නට ඔබට හොඳින් පෙනෙනු ඇත. **(*ශුද්ධවර ලූක්* 6 : 41)**

★**ඉ**ල්ලන්න, ඔබට දෙනු ලැබේ. සොයන්න ඔබට සම්භවේ. තට්ටු කරන්න ඔබට දොර අරිනු ලැබේ. **(*ශුද්ධවර මැතිව්* 7:7)**

## ❊ නව සහශ්‍රයට ධර්මානුශාසනා ❊

### හිතොපදේශයෙන්

ආපද්‍යුන් මාර්ගගමනෙ කාර්‍යකාලාත්‍යයෙෂු ච
කල්‍යාණ වචනං බ්‍රෑයාදපෘෂ්ටොපි හිතො නර:

***අර්ථය*** : විපතක් ඇති විට ද, නොමග යන විට ද, කළයුතු වේලාව ඉක්මවා යනවිට ද, නොවිමසුව ද, හිතවත් මිනිසා හොඳ වචනයක්ම කියන්නේ ය.

**ලො**ව පහළ වූ උදාර මිනිසුන් බොහෝ කැපකිරීම් කර ඇත්තේ හුදෙක් ආත්මාර්ථය සලසා ගැන්ම සඳහා ම නොවේ. මුළු මහත් මිනිස් වර්ගයාගේම යහපත ප්‍රාර්ථනා කරගෙන ය. ලොව වරෙක තැවෙන්නේත්, වරෙක නිවී සැනසෙන්නේත් මිනිසා නිසාම ය. මිනිසාගේ සිතුවිලි නපුරට යොමුවී මිනිසාට එරෙහි වූ දාට ලොව ගිනිගෙන දැවෙනවා ඇත. මිනිසා මිනිසා කෙරෙහි සෙනෙහසින් පිබිදුණු දාට ලොව නිවී සැනසීමට පත්වේ. එනිසා ලොව වාසනාවන්ත කිරීමටත්, ලොව මිනිසාට ජීවත්වීමට අපහසු තැනක් කිරීමටත් හැකියාව පවතින්නේ ද මිනිසා සතුව ය.

කෙනෙකු ආකාර තුනක් වරද්දාගැනීම් කරගන්නා විට ඒ වැරදුණ කෙනාගේ ඇරයුමකින් තොරවම එම වැරදි නිවැරදි කරගැනීම සඳහා වැරැද්ද හොඳින් පෙන්නාදෙන තැනැත්තා හිතවතෙකු බව මෙම පද්‍යය පෙන්වා දෙයි. කෙනෙකුට ජීවිතයේ උතුම් සැනසුම හා සතුට ලබා ගතහැකි වන්නේ අධ්‍යාත්මික සුන්දරත්වයට ළංවීමෙනි. ඒ සඳහා ක්‍රියා කළ හැක්කේ මානව දයාව, සානුකම්පික බව, කෘතවේදීබව හා මිත්‍රත්වය ආදි උදාර ගුණධර්ම වලින් පිරිපුන් කෙනෙකුට පමණකි.

මිනිසෙකු උපදින්නේ තනිව වුවද ඔහුට තනිවම ජීවත්වීමට නොහැකිය. එනිසා ඔහුට අන් අයගෙන් උදව් උපකාර අවශ්‍යවේ. පාලුව, හුදකලාව හා කාන්සිය මෙන්ම ජීවන බර සැහැල්ලුකර ගැනීමට වෙනත් අයගේ සහාය අවශ්‍ය වේ. එසේම ගැටළුවක් කරදරයක් පැන නැගි විටක එය විසඳාගැනීමට තවත් කෙනෙකුගේ පිහිට පතන්නට සිදුවේ. එබැවින් මිනිස් සමාජය තුළ අපමණ ගැටළු වලින් පැනනගින දුක තාපය සමනය කරගැනීමට සත්පුරුෂයන්ගේ සහාය උදව් උපකාර හා උපදෙස් විශේෂයෙන් පිටුවහලක් වේ. ජීවිතයේ අරමුණු බෙහෙවින් සංකීර්ණ තත්වයක් තුළ පවතින සමාජයක ජීවත්වන පුද්ගලයාගේ ජීවිතයද එම සංකීර්ණ බව නිසාම ව්‍යාකූලත්වයට පත්වන්නේය. වත්මන් සමාජයේ ඇතැම් අයගේ ජීවිත අවුල් වූ නූල් පන්දුවක් මෙන් නිවැරදි කර ගැන්මට නොහැකි අන්දමට සංකීර්ණ වී ඇත. එහෙත් එවැනි වැරදි මග යන්නෙකුගේ ජීවිතය නිසිමගට ගැනීමට එය අවබෝධකර දීමට යමෙකු උපකාර කරන්නේ නම් එය ඔහුගේ ජීවිතය ප්‍රබෝධමත් කරගැනීමට බෙහෙවින් බලපාන බව කිවහැකිය.

නොයෙක් අඩුපාඩු මධ්‍යයේ සිට අපි එකිනෙකාගේ අඩුලුහුඩුකම් සොයන්නට, හරි වැරදි සොයන්නට කාලය මිඩංගු කිරීම අමනොඥ ක්‍රියාවකි. තමන් සමග ජීවත්වන කෙනෙකුට හදිසි කරදරයක් අත්වැරැද්දක් සිදුවූ වෙලාවක එය යටි හිතේ තබාගෙන ඒ ගැන සතුටු වන අය අප අතර සිටිතත්, සිනාමුසු මුහුණින් එකට ජීවත්වෙමින් එකට කටයුතු කළත්, සිතිවිලි වශයෙන් ඔවුන්ගේ අදහස් බොහෝ දුරස්ය. එවැනි අපූරු යාළුවන්ට වඩා කෙනෙකුට කරදරයක් ඇතිවූ විටෙක ඉන් ගොඩ ඒම සඳහා උදව් උපකාර කරන්නේ නම්, කෙනෙක් නිසිමග තෝරාගත නොහැකිව වල්මත්ව නොමග යන විටක ඔහු කෙරෙහි සානුකම්පිකව බලා ඔහු නිසිමගට යොමු කරන්නේ නම් හා නිසි කල කටයුතු ඉටුකර නොගෙන ජීවිතය අවුලක් කරගන්නා විටක නියමිත කලට නියමිත කාරණය නිමාකිරීමට උපදෙස් දෙන්නේ නම් ඔහුගේ පවුල සමබර තාවකින් පවත්වාගෙන යාමට හැකිවන්නේය. එකල්හි ඔවුන්ගේ ජීවිතය හරවත් රසවත් එකක් බවට පත්වන්නේය. එනිසා මනෘකල්පිත ලෝකයන් මවාගෙන ඒවායේ සතුට සොයන්නට නොගොස් උතුම් හිතවතුනගේ සදුපදේශයන් පිළි පදිමින් නිසිමග යමින් නිවැරදි දෙයම කරන්නේ නම් නිසැකවම ජීවිතයේ සතුට ළඟකරගත හැකි ය.



♦ *රාජකීය පණ්ඩිත - ශාස්ත්‍රපති*
***පූජ්‍ය විල්ඔය විමලජෝති හිමි***
***ලන්ඩන් බෞද්ධ විහාරය***
**London Buddhist Viharaya**
**The Avenue, London W4**

**NORMA & Co**
**Associate Solicitors**

**2 Queens Parade**
**Green Lanes, London N8 0RD**
**Tel. 020 8348 7772 / 07717173414**

**Any type of Visa Applications**
**Car Accidents**

***Colombo Office***
**Visa Applications & Any Refusals**
**100/6 Rosemead Place**
**Colombo 7**
**Tel. 2672432 / 0777686632**